සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2007 වර්ෂයේ ජනවාරි - මාර්තු කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,655 - 2010 මැයි මස 21 වැනි සිකුරාදා - 2010.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 746 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 760 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මැයි මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 මැයි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


743 - B 079865 — 8835 (2010/05)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය:-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම.
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු

*ගාල්ල දිස්ත්‍රික්කය*

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01.ඉල්ලුම්කරුවන් අදාළ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

02. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපාකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කරන ඇති දැන්වීම්වලින් බලා ගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 ජූනි මස 18 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 අප්‍රේල් මස 30 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාශය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | බලපිටිය | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාශයේ වැලිතර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

05-415

---

## අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### කම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) හා (සිංහල/ඉංග්‍රීසි) තනතුරු

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, කම්කරු විනිශ්චය සභා කාර්යාලවල භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) හා (සිංහල/ඉංග්‍රීසි) තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් පළ කරන ලද 2009 නොවැම්බර් 27 වන දිනැති අංක 1630 දරන ගැසට් නිවේදනය මෙයින් අවලංගු කරන අතර, ඒ සඳහා පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් නැවත අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) පරිවර්තනයට අදාළ භාෂා විෂයයන් දෙක ඇතුළුව විෂයයන් 4 ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර

ගණනකදී ගණිතය ඇතුළු විෂයයන් 6කින් ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අ.පො.ස. (සා/පෙළ) හෝ ජා. පො. ස. විභාගය සමත් වීම.

03. *වෙනත් සුදුසුකම්.-*

(ආ) (i) අයැදුම්කරුවන් සුදුසුකම් ලබා තිබෙන විභාගය සමත් වූ මාධ්‍යයට අමතරව වෙනත් භාෂාවකින් (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) නිවැරදිව හා පැහැදිලිව කථා කිරීමට සමත්විය යුතුය.

(ii) එක් භාෂාවකින් (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තවත් භාෂාවකට හෝ වැඩි ගණනකට භාෂණ පරිවර්තනය කිරීමේ හැකියාව තිබිය යුතුය.

04. *වයස් සීමාව* :- අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සිටින අයැදුම්කරුවනට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

05. වැටුප් පරිමාණය :
MN-1-2006 - ඒ (iv) පියවර 06

මාසිකව රු. 13,845-5 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040

06. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.-*අංක 15/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ඉහත සුදුසුකම් සපුරා ඇති අයැදුම්කරුවන් අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත සහ වාචික පරීක්‍ෂණය ඇතුළත් තරග විභාගයක ප්‍රතිඵල අනුව තීරණය වන කුසලතාව පදනම් කරගෙන බඳවා ගැනීම සිදු කරයි.

(අ) *ලිඛිත පරීක්‍ෂණය.-* භාෂා පරිවර්තනය කිරීමේ හැකියාව මැන බලන පැය දෙකක ප්‍රශ්න පත්‍රයකි. මුළු ලකුණු - 100 කි.

(ආ) *වාචික පරීක්‍ෂණය.-*

(I) ලිඛිත පරීක්‍ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව 1:5 අනුපාතය මත වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ. උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 50 කි.

(II) වාචික පරීක්ෂණයේදී අයැදුම්කරුවන්ට එක් භාෂාවකින් තවත් භාෂාවකට හෝ වැඩි ගණනකට භාෂාණ පරිවර්තනය කිරීමේ හැකියාව මැන බලනු ලැබේ.

07. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) මෙම තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග වසරකට වරක් අධිකරණ ලේකම් විසින් පවත්වනු ලැබේ.

08. *සේවා කොන්දේසි* :- ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.

09. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයැදුම්පත්‍රය අනුව සම්පූර්ණකළ අයැදුම්පත් 2010.06.10 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය. අයැදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "කම්කරු විනිශ්වය සහා භාෂාණ පරිවර්තක තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සිය අයැදුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රාධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

ලේකම්,
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

10. *විභාග ගාස්තු.-* අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් නමට ලියූ ඕනෑම තැපැල් කාර්යාලයකින් ගෙවිය හැකි මුදල් ඇණවුමක් මගින් රු. 100/- ක විභාග ගාස්තුවක් සෑම අපේක්ෂකයකු විසින්ම ගෙවිය යුතුය. මුදල් ඇණවුම් අයැදුම්පත් සමග එවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

11. ඉල්ලුම්පත්‍රය සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයැදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි තැපෑලේදී නැති වූ බවට කරන පැමිණිලි සළකා බලනු නොලැබේ.

12. යම් අයැදුම්කරුවකුගේ අයැදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වේ.

අධිකරණ අමාත්‍යංශ ලේකම්.

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
කොළඹ 12.

### ආදර්ශ අයැදුම්පත්‍රය

*අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය*

*කම්කරු විනිශ්වය සහා භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) හා (සිංහල/ඉංග්‍රීසි) තනතුරු සඳහා ඇයදුම්පත්‍රය*

අංකය :————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. සම්පූර්ණ නම :
සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

02. මුලකුරු සමග නම :
සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

03. පුද්ගලික ලිපිනය :
සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

04. කාර්යාලයීය ලිපිනය :————.

05. දුරකථන අංකය :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. උපන් දිනය :————.

08. 2010.06.10 දිනට වයස

අවු. :————., මාස :————., දින :————.

09. ස්ත්‍රී/පුරුෂභාවය :————.

10. පුරවැසිභාවය :————.

11. ඉගෙනගත් භාෂා මාධ්‍යය :————.

12. අයැදුම් කරන්නේ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) තනතුර ද නැතහොත් (සිංහල/ඉංග්‍රීසි) තනතුරට ද යන වග :————.

13. අධ්‍යාපන සුදුසුකම් :
*අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය*
*වර්ෂය :............................ විභාග අංකය :..........................................*

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

14. වෙනත් සුදුසුකම් :

15. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කරන තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බැව් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, තෝරා පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

*ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත අයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.-*

'ආ' කොටස (ආයතන ප්‍රධානියාගේ නිර්දේශය)

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන ..................... මයා/මිය /මෙනෙවිය .............. දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ/පළාත් සභාවේ .................... වශයෙන් සේවය කරන බවත්, ඉහත දක්වා ඇති විස්තර නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක බවත්, මම සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත්
නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

05-416

---

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව**

ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත දැක්වෙන වෘත්තීන්වල ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී.

1. වෘත්තීන් හා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්:-

(අ) ගුවන් යානා ඉංජිනේරු වෘත්තීන්

(1) ගුවන්යානා යන්ත්‍ර ශිල්පී (පිරිමි/කාන්තා)

(2) ගුවන්යානා සැකිලි ශිල්පී (පිරිමි/කාන්තා)

(3) ගුවන්යානා විදුලි හා මෙවලම් ශිල්පී (පිරිමි/කාන්තා)

(4) ආරක්ෂක උපකරණ ශිල්පී (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ආ) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන්

(1) පරිගණක කාර්මික ශිල්පී (පිරිමි)

(2) ගුවන්විදුලි සංනිවේදක (පිරිමි)

(3) දුරකථන ක්‍රියාකරු (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඇ) සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන්

(1) අවිආයුධ ශිල්පී (පිරිමි)

(2) රථවාහන කාර්මික ශිල්පී (පිරිමි)

(3) ගුවන් ඡායාරූප ශිල්පී (පිරිමි)

(4) සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පී (පිරිමි)

(5) ගුවන් යානා ගිනියම් පැස්සුම්කරු (පිරිමි)

(6) මතුපිට කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය හෝ විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(7) ප්‍රවාහන ක්‍රියාකරු (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. රියදුරු බලපත්‍රය ලබා තිබීම අනිවාර්‍යයවේ.

(ඈ) සිවිල් ඉංජිනේරු වෘත්තීන්

(1) විදුලි කාර්මික ශිල්පී (පිරිමි)

(2) යාන්ත්‍රික කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඉ) *වෛද්‍ය වෘත්තීය* :

හෙද සහයක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය/රසායන විද්‍යාව/භෞතික විද්‍යාව/ කෘෂි විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනක් එක් වරක දී සමත්ව තිබීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් ලෙස සැලකේ.

(ඊ) *දන්ත වෛද්‍ය වෘත්තීය* :

දන්ත සහයක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය/රසායන විද්‍යාව/භෞතික විද්‍යාව/ කෘෂි විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනක් එක් වරක දී සමත්ව තිබීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් ලෙස සැලකේ.

(උ) *සැපයීම් වෘත්තීන්* :

(1) සැපයුම් සහයක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතය/ විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) භෝජනාගාර සහයක (කාන්තා) :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඌ) *පරිපාලන වෘත්තීන්* :

(1) පරිපාලන සහයක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(2) ගිණුම් සහයක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතය/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(එ) *මෙහෙයුම් වෘත්තීන්* :

(1) මෙහෙයුම් ගුවන් (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) ගිනි නිවන්නා (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(3) සංගීතඥ (කාන්තා)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. සංගීතයෙන් හෝ ගායනයෙන් දක්වන කුසලතාවයන් තෝරා ගැනීමේ දී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(4) ශාරීරික අභ්‍යාස පුහුණුකරු (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ක්‍රීඩාවලින් ජාතික මට්ටමින් ලබාගත් ජයග්‍රහණයන් තෝරා ගැනීමේ දී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(5) සුනඛ පාලක (පිරිමි)

(6) මෙහෙයුම් භූමි (කාන්තා)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඒ) පොලිස් වෘත්තිය

පොලිස් භට (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

3. *අනෙකුත් සුදුසුකම්* :

ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුය.

(අ) *පුරවැසි භාවය* : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

(ආ) *වයස* :

පිරිමි - 2010 ජූලි මස 20 වැනි දිනට වයස අවුරුදු 18ත් 23ත් අතර
කාන්තා - 2010 ජූලි මස 20 දිනට අවුරුදු 18ත් 22ත් අතර

(ඈ) උස : පිරිමි - අඩි 5 අඟල් 5 ට නොඅඩු විය යුතුයි.
කාන්තා - අඩි 5 අඟල් 3 ට නොඅඩු විය යුතුයි.

(ඈ) බර : ශරීර ස්කන්ධ දර්ශකය : $\frac{\text{බර(කි.ග්‍රෑ)}}{\text{උස(මී)}^2} < 25$

(ඉ) වර්ණ දෘෂ්ටිය : සීපී 2

(ඊ) දෘෂ්ටි තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිතව)

(උ) සිවිල් තත්වය : අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවන තුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන්භටයින්ට/ගුවන්කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

3. පළමුවන ඡේදයෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ දෙවන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. *සේවා කොන්දේසි :*

(අ) ගුවන්භටයින්/ගුවන් කාන්තාවන් සේවයට බැඳුණුදා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(ආ) තෝරාගනු ලබන සියලුම වෘත්තීන්වල අදාළ ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුවත් ඉන් පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුව ද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශ රටක දී ඉටුකළ යුතුය.

6. *බඳවා ගැනීමේ කොන්දේසි.-* තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන පන්තියේ ගුවන් භට / ගුවන් කාන්තා ශ්‍රේණියට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12 ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08 ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04 ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවක දී වාර්තා කළ යුතුයි. අවුරුදු 08 ක සේවය අවසන් වූ පසුව තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ඇත.

7. රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්.- තෝරා ගනු ලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියා කළ යුතුයි.

8. *වැටුප් හා දීමනා :-*

(අ) වසරකට ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අදාළ ඒකාබද්ධ වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ.

ගුවන්භට/කාන්තා - රු. 168,000 - 6 x 1,440 - 21 x 1,800 = රු. 214,440/-

නායක ගුවන්භට/කාන්තා - රු. 172,320 - 3 x 1,440 - 24 x 1,800 = රු. 219,840/-

කෝප්‍රල් - රු. 176,640 - 1 x 800 - 17 x 2,520 = රු. 221,280/-

සැරයන් - රු. 180,240 - 3 x 1,800 - 9 x 2,520 - 15 x 3,480 = රු. 260,520/-

බලපත්ති සැරයන් - රු. 183,120 - 10-2,520 - 19 x 3,480 = රු. 274,440/-

බලලත් නිළධාරීන් - රු. 211,800 - 27 x 3,480 = රු. 305,760/-

ඉහත දැක්වෙන පරිදි වාර්ෂික ඒකාබද්ද වැටුප් පරිමාණයන්ට අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. සේවා කාලය, යහපත් කල්ක්‍රියාව සහ කාර්යක්ෂමතාව මත ඉදිරි නිලයන් පිරිනමනු ලබන අතර ඒ අනුව නියමිත වැටුප් දර්ශකයන්හි පිහිටවනු ලැබේ.

*(ආ)* දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 4,500 ක් ගෙවනු ලැබේ.

(2) දුෂ්කර දීමනා මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.

(3) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන්හට මසකට රු.3,900 ක් ගෙවනු ලැබේ.

(4) විශේෂ දීමනාව මසකට රු. 2,400 ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 80 බැගින්)

(5) දිරි දීමනා.- සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට රු. 250 සිට 850 දක්වා).

(6) ආහාර දීමනා.- පිටත වාසය කරන ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට රු. 8915.40 බැගින් ගෙවනු ලබන අතර කඳවුරු තුළ වාසය කරන ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.

(7) නේවාසික පහසුකම්.- කඳවුර තුළ වාසය කරන ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට නොමිලේ සපයනු ලැබේ.

(8) ගමනාගමනය.- වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් භටයා/ගුවන් කාන්තාව/ස්වාමිපුරුෂයා භාර්යාාව/ළමයින්ට අදාළ පරිදි) ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(9) වික්ෂේපණ දීමනා.- මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)

(10) සුදුසුකම් වැටුප්.- ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50)

(11) යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා.- මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ටය. (මසකට රු. 30 සිට රු. 204 දක්වා)

(12) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.- මසකට රු. 170 ක් ගෙවනු ලැබේ.

(13) නැවත සේවයට බැඳීමේ වැටුප්.- නැවත සේවයට බැඳෙන ගුවන් හටයන්ට/ගුවන් කාන්තාවන්ට මසකට රු.300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(14) වෛද්‍ය පහසුකම්.- ගුවන් හමුදාව මගින් සෑම ගුවන් හටයකුටම/ගුවන් කාන්තාවකටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඔහුගේ/ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(15) කඳවුරුවල සිට සැතපුම් 30 ක (කි. මී. 48 ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් හටයන්/ගුවන් කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(16) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන්හටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට රු. 1,200 සිට රු. 3,300 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමිවේ.

(17) උපදේශක දීමනාව.- මසකට රු. 425 සිට රු. 510 දක්වා දීමනාවක් හිමිවේ.

(18) වෙනත් දීමනා.- (වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(19) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන්හටයින්/ගුවන් කාන්තාවන් දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

17. *ඉල්ලුම්කරුට/ඉල්ලුම්කාරියට උපදෙස් :*

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2010 මැයි මස 31 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ, "ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන ඉල්ලුම්පත් බාර ගනු නොලැබේ.) අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. එක් අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම්කළ යුතු අතර සහභාගි විය හැක්කේ එක් සම්මුඛ පරීක්ෂණයකට පමණි. වෘත්තීන් කීපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකල, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර වෙත ලැබුණාවූ ද මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ද ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන් හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු /සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතුය.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)

(2) අවශ්‍යය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික.

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව සහ /හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු/අයදුම්කාරිය ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබූවිට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිදු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

10. සම්මුඛ පරීක්ෂණය ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඒකළ කඳවුරේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණයන්ට සුදුසු යැයි සලකනු ලබන අපේක්ෂික/අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය පෞද්ගලිකව දන්වනු ලැබේ.

11. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

12. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. (ශාරීරික අභ්‍යාස පුහුණුකරුවන්ට සහ සංගීතඥයින් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වේ) සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

13. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට/ඇයට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගුවීමට හේතු වන්නේ ය.

14. ඉල්ලුම්පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

15. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව් ඩී ආර් එම් ජේ ගුණතිලක,
එයාර් චීෆ් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා අයදුම්පත**

1. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :—————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
3. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :—————.
4. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :—————.
5. ස්ථිර ලිපිනය :—————.
6. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.
7. දිස්ත්‍රික්කය :—————.
8. මැතිවරණ කොට්ඨාසය :—————.
9. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.
10. දුරකථන අංකය :—————.
11. උපන් දිනය :—————.
12. විවාහක/අවිවාහක බව :—————.
13. උස : අඩි :—————, අඟල් :—————.
14. අ.පො.ස. (සා.පෙළ) විභාගය :

| *අවුරුද්ද* | *විභාග අංකය* | *සමත් වූ විෂයයන්* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

15. අ.පො.ස. (උ.පෙළ) විභාගය :

| *අවුරුද්ද* | *විභාග අංකය* | *සමත් වූ විෂයයන්* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

16. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ආදිය) :—————.

17. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ටතා පිළිබඳ විස්තර :—————.

18. පාසලේ දී හෝ බාහිර සංවිධානවලදී ලබා ඇති වෙනත් විශිෂ්ටතා :—————.

19. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :—————.

20. සිවිල් හෝ යුද්ධ අධිකරණයේ දී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේද ?එසේ නම් විස්තර සඳහන් කරන්න :—————.

21. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවි නාමය* | *ලිපිනය* |
|---|---|---|
| | | |

22. ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශයඃ-

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

—————,
ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කාරියගේ අත්සන.

දිනය :—————.

05-495

---

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මීට යාකර ඇති ආදර්ශ අයදුම්පත්‍ර අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2010.06.10 වැනි දින හෝ ඊට පෙරාතුව ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 07, අංක 230, බෞද්ධාලෝක මාවතේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්පත බහාලන ලියුම්කවරයේ උඩ වම්පස කෙළවරේ "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

මෙම දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. *වැටුප් ක්‍රමය.-* පුහුණුවීම් කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු මෙම තනතුර සඳහා මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය රුපියල් 15,005 - 4x180 -14 x 240 - 19,085 වේ. (රු. 16,205 ට වාර්ෂික වැටුප් පියවරට පූර්වයෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ඇත.)

3. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

*(අ)* ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය ;

*(ආ)* 2010.06.10 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට වැඩි නොවිය යුතුය. (පළාත් හා රාජ්‍ය සේවයෙහි නියුතු සේවකයින් කෙරෙහි ඉහළ වයස් සීමාව බලපාන්නේ නැත.) ;

*(ඇ)* මනා චරිතයකින් යුක්ත විය යුතුය ;

*(ඇ)* යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු අයෙකු විය යුතුය. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළහැකි වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍යය.

(ඉ) පහත සඳහන් (I) හෝ (II) යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් වලින් එකක් ලබා තිබිය යුතුය :

(I) භාෂාව, ගණිතය, ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ තවත් එක් විෂයයකින් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම ; සමග

භෞතික විද්‍යාව හා ශුද්ධ ගණිතය ඇතුළුව අවම වශයෙන් විෂයයන් හතරකින් (04) සාමාන්‍ය සාමාර්ථයන් සහිතව එක් වරක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම ;

*හෝ*

නව නිර්දේශය අනුව භෞතික විද්‍යාව හා සංයුක්ත ගණිතය ඇතුළුව විෂයයන් තුනකින් (03) සාමාන්‍ය සාමාර්ථයන් සහිතව එක් වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම.

(II) එක් අවුරුද්දක ප්‍රායෝගික (ක්ෂේත්‍ර) පුහුණුවක් සහිතව මොරටුව විශ්වවිද්‍යාලයෙන් හෝ අම්පාර හාඩි කාර්මික විද්‍යාලයෙන් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකය (සිවිල් ඉංජිනේරු) ලැබ සිටිය යුතු අතර, මැනීම හා මට්ටම් ගැනීම සහ වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව යන විෂයයන් ද ඇතුලත්ව අදාළ විභාගය සමත්වී තිබිය යුතුය.

*සටහන.-* පාඨමාලාව සම්පූර්ණ කර ඇති එහෙත් සහතිකය ලබා නොමැති අයදුම්කරුවන්ට ද අයදුම් කළ හැකි අතර, ඔවුන් එකී සහතිකය සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

4. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

*(අ)* සියලුම බඳවා ගැනීම් අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාර සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු කෙරෙනු ඇත.

*(ආ)* (i) ඉහත 3.ඉ.I යටතේ සඳහන් සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගල්ගමුව අභ්‍යාස ආයතනයේ නේවාසිකව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලාව දෑවුරුදු කාල සීමාවක් තුළ හැදෑරිය යුතුය. එහිදි අවසාන ලිඛිත පරීක්ෂණය ඇතුළුව නියමිත විභාගවලින් සමත්වන අභ්‍යාසලාභීන් එක් අවුරුදු ප්‍රායෝගික පුහුණුවක් සඳහා ක්ෂේත්‍රයට අනුයුක්ත කරනු ඇත. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සෑහීමට පත්වන සේ සතුටුදායක ලෙස එම ක්ෂේත්‍ර පුහුණුව නිම කිරීමෙන් පසුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අභ්‍යාස ආයතනය මගින් පිරිනමනු ලබන වාරිමාර්ග ඉංජිනේරුමය ඩිප්ලෝමා සහතිකය ලැබීමට සුදුසුකම් ලබති.

(ii) නියමිත විභාගවලින් අසමත් වන වාරිමාර්ග ආධුනිකයින්ට එසේ අසමත් වූයේ වැඩ කටයුතු පැහැර හැරීම, උනන්දුව නැතිවීම හෝ අයහපත් පැමිණීම නිසා නොවේ නම්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි ඔවුන්ගේ පුහුණුව මාස හයකට නොවැඩි කාල පරිච්ඡේදයකින් දීර්ඝ කරවා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ඇත. අසමත් වූ ආධුනිකයින් එසේ දීර්ඝ කරන ලද පුහුණුවීමේ කාල පරිච්ඡේදය අවසානයේ දී ඔවුන් සඳහා පවත්වන අවසාන විභාගය ඇතුලු නියමිත විභාග සියල්ලෙන්ම සමත්විය යුතුය. එම විභාගය ද අසමත් වන ආධුනිකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

(iii) පුහුණුව ලබන කාලය තුල දී ආධුනිකයින් යටත් පිරිසෙයින් දේශන වලින් 80% කට වත් සහභාගි වී සතුටුදායක පුහුණුවීම් වාර්තාවක් ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අවශ්‍ය අවම පැමිණීම හා සතුටුදායක පුහුණුවීමේ වාර්තාවක් නැති යම්කිසි ආධුනිකයෙක් වෙතොත් නියමිත විභාගයට පෙනී සිටීමට ඉඩ නොදෙන අතර, පුහුණුව ද අවසන් කරනු ලැබේ.

(iv) ඉහත 3.ඉ.II යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින් දේශන හා ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත් වන සේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන හයමසක පුහුණුවකින් පසුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(v) මෙම අභ්‍යාසලාභීන් ලබා ඇති එක් වසරක ක්ෂේත්‍ර පුහුණුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ සාර්ථකව ලබා ගෙන ඇත්නම් බඳවා ගැනීමෙන් පසුව ආධුනිකයින් ලැබිය යුතු හය (6) මසක පුහුණුවීමේ කාල සීමාවෙන් නිදහස් කරනු ලබන අතර, ඔවුන් සියලු දෙනාම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිට සමත් විය යුතුය.

*(ඇ)* සියලුම දේශන හා පුහුණු පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

*(ඈ)* පුහුණුව සාර්ථකව අවසාන කරන අය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුරට පත්කරනු ලැබේ.

5. *සේවා කොන්දේසි.-*

*(අ)* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකර ගනු ලැබේ.

*(ආ)* අයදුම්කරුවන් ප්‍රථම වශයෙන් වාරිමාර්ග ආධුනිකයන් වශයෙන් බඳවා ගැනේ.

*(ඇ)* *වාරිමාර්ග ආධුනිකයින් සඳහා පුහුණුව ලබන කාලසීමාව තුළ දෙනු ලබන දීමනාවන්.-* 3.ඉ.I සුදුසුකම් සහිතව බඳවා ගනු ලැබූ වාරිමාර්ග ආධුනිකයින්හට පුහුණුව ලබන සම්පූර්ණ කාලය තුළදී පහත සඳහන් පරිදි දීමනාවන් ගෙවනු ලැබේ.

පළමු වසර සඳහා මසකට රු. 12,920 බැගින් ;

දෙවන වසර සඳහා මසකට රු. 13,040 බැගින් ;

තුන්වන වසර සඳහා මසකට රු. 13,160 බැගින් ;

3.ඉ.II සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින්හට ඔවුන්ගේ හය මසක පුහුණු කාලය තුළදී මසකට රු. 13,160 බැගින් දීමනාවක් ගෙවනු ලැබේ.

මෙම දීමනාව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අවසරය පරිදි දීර්ඝ කරනු ලබන පුහුණුවීමේ කාල පරිච්ඡේදයෙහි දී ලැබීමට හිමිකම් ඇත. වෙනත් වරප්‍රසාද හෝ හිමිකම් කිසිවක් නොලැබේ.

*(ඈ)* වාරිමාර්ග ආධුනිකයින් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට හා රජය මගින් වරින් වර නිකුත් කරන වෙනත් රෙගුලාසිවලට යටත් විය යුතුය. පුහුණුව ලබන කාලසීමාව තුළදී ඔවුනට නිවාඩු හෝ නිවාඩු දුම්රිය බලපත් ලැබීමට හිමිකම් නැත.

*(ඉ)* මෙම පත්වීම් ආධුනික කාලය සම්පූර්ණ කරන ලදුව II වැනි පන්තිය II වැනි ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර විධිමත් පත්වීම් භාරගත් දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

*(ඊ)* මෙම සේවය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්තිවල විධිවිධාන අදාළ වේ.

*(උ)* තෝරා ගන්නා ලද අයදුම්කරුවන් වසර 5 ක අනිවාර්ය සේවා කාලයක් ඉංජිනේරු සහකාර තනතුරේ සේවය කරන බවට ගිවිසුමකට අත්සන් කළ යුතුය. ඊට පෙර සේවයෙන් ඉවත්වීමට අවශ්‍ය වුවහොත් ගිවිසුමේ සඳහන් මුදල රජයට ගෙවිය යුතුය.

6. අයදුම්කරු අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය :

(i) ලබාගෙන ඇති තාක්ෂණික සහතිකයන්,
(ii) අ.පො.ස (උ.පෙළ) සහතික පත්‍රය,
(iii) අ.පො.ස. (සා.පෙළ) සහතික පත්‍රය,
(iv) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතිකය.
(v) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (මින් එක් සහතිකයක් අවසන් වරට ඉගෙනගත් පාසලේ හෝ විද්‍යාලයේ විදුහල්පතිගෙන් සහ තවත් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගේ විය යුතුය.).

*සටහන.-* ඉහත සඳහන් සහතිකවල පිටපත් ආපසු දෙනු නොලැබේ.

7. පළාත් සහ රාජ්‍ය සේවාවන් හි නියුතු සේවකයින් ඔවුන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

8. අයදුම්කරුවන් කොළඹ දී පැවැත්වෙන ලිඛිත විභාගයකට සහ සම්මුඛ පරීක්ෂණයට ඔවුන්ගේම වියදමෙන් පෙනී සිටිය යුතුය.

9. සේවා අවශ්‍යතාවය මත ඕනෑම අවස්ථාවක දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ඔවුන් සූදානමින් සිටින යුතුය. දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් වැඩබිම් බොහෝවිට ප්‍රවාහන හා නවාතැන් පහසුකම් අඩු දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති බව අයදුම්කරුවන් වටහා ගත යුතුය. තෝරාගන්නා ලද අයදුම්කරුවන් විශේෂයෙන්ම පහත සඳහන් සේවා ස්ථානවලට අනුයුක්ත කරන අතර එම සේවා ස්ථානවල අවම වශයෙන් අවුරුදු 05 ක් සේවය කළ යුතුය. එම සේවා ස්ථාන වල සේවය කිරීමට අකැමැත්තක් දක්වන අය ඉල්ලුම්පත් ඉදිරිපත් නොකළ යුතුය. එම සේවා ස්ථාන අම්පාර, පොතුවිල්, කල්මුණේ, අක්කරපත්තු, පදවිය, රාජාංගනය, හුරුළුවැව, මාපාකඩ, බදුල්ල, කන්දකැටිය, නවකිරි, රුගම්, තිස්ස, වීරකැටිය, හම්බන්තොට, වැල්ලවාය, බිබිල, මොණරාගල, පොළොන්නරුව, කවුඩුල්ල, ඇලහැර, ඉගිනිමිටිය, පුත්තලම, මුතූර්, කන්තලේ, ගෝමරන්කඩවල, මුරුක්කන්, වවුනියාව වැනි වාරිමාර්ග කොට්ඨාස සහ ව්‍යාපෘති කාර්යාල වේ.

10. අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබීමට ඉඩ තිබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවා ගනු ලැබීමෙන් අනතුරුව අනාවරණය වුවහොත් ඔහුගේ සේවය අවසන් කෙරෙනු ඇත. මීට අමතරව අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට එරෙහිව නීති මගින් දඬුවම් ලබා දීමට සිදුවනු ඇත.

11. රජයේ තනතුරුවලට පත් කර ගනු ලැබීම සම්බන්ධයෙන් බලපවත්වන රීති සහ රෙගුලාසි සඳහා ශ්‍රී ලංකා රජයේ ගැසට් පත්‍රයේ I කොටසේ II අ ඡේදය කෙරෙහි අවධානය යොමු කෙරේ.

ඉංජි. එච්. පී. එස්. සෝමසිරි,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2010 මැයි මස 07 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
අංක 230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

*අයදුම්පත්‍රය*

*වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය*

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

*වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර*

1. (අ) සම්පූර්ණ නම :————.
(ආ) මුලකුරු සමග නම :————.
2. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
3. (අ) ලිපිනය :————.
(ආ) ස්ථිර පදිංචි ලිපිනය :————.
(ඇ) දුරකථන අංකය : නිවස :————.
ජංගම :————.
(ඈ) විද්‍යුත් තැපැල් ලිපිනය :————.
4. පදිංචි දිස්ත්‍රික්කය :————.
5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :————.
6. උපන් දිනය : (උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න) :————.
(අ) අවුරුද්ද :————, මාසය :————, දිනය :————.
(ආ) උපන් ස්ථානය :————.
(ඇ) 2010.06.10 දිනට වයස අවුරුදු :——. මාස :——. දින :——.
7. ජාතික හැඳුනුම්පත් අංකය :————.
8. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද? ඔව්/නැත :————.
ජාතිය :

| | | | |
|---|---|---|---|
| සිංහල | ☐ | මුස්ලිම් | ☐ |
| ශ්‍රී ලංකා ද්‍රවිඩ | ☐ | වෙනත් | ☐ |
| ඉන්දියානු ද්‍රවිඩ | ☐ | | |

9. අධ්‍යාපනික සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණන්න)

9.1 අ.පො.ස (සා.පෙළ) විභාගය :

පළමුවර :
විභාග අංකය :————. අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |

දෙවනවර (අවශ්‍යනම්) ඃ

විභාග අංකය :————. අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |

9.2 අ.පො.ස (උ.පෙළ) විභාගය ඃ

විභාග අංකය ඃ අවුරුද්ද ඃ

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. ගණිතය | |
| 2. භෞතික විද්‍යාව | |
| 3. | |
| 4. | |

10. තාක්ෂණික සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණන්න) :————.
(පාඨමාලාව හා කාර්මික විදුහලේ නම සඳහන් කරන්න)

11. ඔබ කලින් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවය කොට සේවය අතහැර ගියේ ද/අස්වූයේ ද/සේවය නතර කරනු ලැබුවේ ද/සේවයෙන් පහකරනු ලැබුවේ ද? එසේනම් ඊට හේතු :————.

12. ඔබ දැනට රැකියාවක යෙදී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :.

(අ) තනතුර :————.

(ආ) ආයතනය :————.

(ඇ) පත්වීම් ලද දිනය :————.

(ඈ) පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/අනියම්) :————.

13. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු එවැනි දෑ අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මෙයින් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රජයේ දෙපාර්තමේන්තුවක/පළාත් රාජ්‍ය සේවයක අයදුම්කරුවන් සඳහා පමණි.)*

............................................................ මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, මෙම තනතුරට අයදුම් කිරීම සඳහා නියමිත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවලට අනුකූල බවත්, මම මින් සහතික කරමි. ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් වැඩිදුරටත් සඳහන් කිරීමට රිසියෙමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව).

නම :————,
තනතුර :————,
ලිපිනය :————,
දිනය :————.

05-563

---

## ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I පන්තියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 3 ඡේදයේ 2 වැනි වගන්තියෙහි සඳහන් විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු සඳහා නිලධාරීන් උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අංක 1457/2 හා 2006.08.14 දිනැතිව නිකුත් කළ *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත අංක 1419/3 හා 2005.11.14 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව 2005.01.01 දින සිට 2010.12.31 තෙක් කාලයට අදාළව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම 17(ඇ) වගන්තිය යටතේ සිදු කරනු ලැබේ.

03. *උසස් කිරීමේ ක්‍රමය.-*

3.1 පිරවීමට ඇති ඇබෑර්තු සංඛ්‍යාව මෙන් දෙගුණයකට වඩා වැඩි නොවන නිලධාරීන් සංඛ්‍යාවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සාමාජිකයින් 03 දෙනෙකුගෙන් සමන්විත වන මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

3.2 පහත 04 ඡේදයේ 4.1 හා 4.2 යටතේ දැක්වෙන 1 හා 2 කාණ්ඩ යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් තනතුරු පුරප්පාඩුවලින් 80% ද, ඡේද 4.3 හා 4.4 යටතේ දැක්වෙන 3 හා 4 කාණ්ඩ යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් තනතුරු පුරප්පාඩුවලින් 20% ද ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාව මත උසස් කිරීම මගින් පුරවනු ලැබේ.

ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය සලකා බැලීමේ දී සේවා ව්‍යවස්ථාවේ 14 (1) ඇ හෝ 19(1) (ආ) සුදුසුකම් ලබා තිබීම හෝ අන්තර්කාලය තුළ එම සුදුසුකම් සම්පූර්ණ කළ හැකි වීම කුසලතාවය වශයෙන් සලකනු ලැබේ. (අමප/09/2906/317/105 හා 2010.01.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය) ඒ අනුව කුසලතාවය ලබා ඇති නිලධාරීන්, උසස් වීමට පෙර ශ්‍රී ලං.ප.සේ. I පන්තියේ/ශ්‍රේණියේ පැවති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

3.3 ඒ අනුව එක් එක් උසස්වීම් දිනට අදාළ ජ්‍යෙෂ්ඨතා ලේඛනය, එම එක් එක් දිනයන්ට උසස් වීමට සුදුසුකම් ලැබූ නිලධාරීන් උසස් වීමට පෙර පැවති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් සැකසේ.

3.4 2005.01.01 දිනට අදාළව, සිදු කරන උසස්වීම් අංක අමප/09/1372/317/048 හා 2009.10.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සිදු කරනු ලැබේ.

04. සුදුසුකම්.- පහත කාණ්ඩ 4 අතුරින් ඕනෑම එක් කාණ්ඩයකට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතුය :

4.1 *කාණ්ඩය 1* : සේවා ව්‍යවස්ථාවේ 17 (ඇ) (1) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා :

4.1.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ/පන්තියේ වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම. (ආයතන සංග්‍රහයේ V : 2,5,4, XII :16:9,XII :16 : 10 සහ XII :36 :1:4 (i) හා (ii) යන කොන්දේසි සහ විනය තීරණ වල කොන්දේසි යටතේ වසර 5 ක කාල සීමාව ගණනය කළ යුතුය)

4.1.2 සේවා ව්‍යවස්ථාවේ 14(1) (ඇ) හෝ 19(1) (ආ) යටතේ වන සුදුසුකම් සපුරා තිබීම හෝ අන්තර්කාලය තුළ සම්පූර්ණ කිරීමට හැකි බව නීත්‍යානුකූලව පිළිගත හැකි ලේඛන මගින් තහවුරු කළ හැකි වීම.

4.1.3 උසස් වීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන දිනට පූර්වාසන්න වසර 5 තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම සහ විනයානුකූල දඬුවමකට ලක්ව නොතිබීම. (ආයතන සංග්‍රහයේ XII:16 :7 යටතේ ලබන වැටුප් වර්ධක උසස් වීම් සඳහා සලකා නොබලන බව ආයතන සංග්‍රහයේ XII:16 : 9 හි සඳහන් හෙයින් මෙහි දී අදාළ කරන ගනු නොලැබේ).

4.1.4 4.1.3 හි සඳහන් කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම් අනුව වැඩ හා හැසිරීම යහපත් බවට නිර්දේශ කර තිබීම.

4.2 *කාණ්ඩය 2* : සේවා ව්‍යවස්ථාවේ 17(ඇ) (I) සටහන 1 යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා :

4.2.1 2005.11.14 දිනට හෝ පෙර, විශේෂ ශ්‍රේණියේ තනතුරකට විධිමත් පත්වීමක් ලබා තිබීම.

4.2.2 2005.11.14 දිනට හෝ පෙර, සේවා ව්‍යවස්ථාවේ 14(1)(ඇ) සුදුසුකම් සපුරා තිබීම.

4.2.3 ඉහත 4.1.3 හා 4.1.4 අවශ්‍යතා සපුරා තිබීම.

4.3 *කාණ්ඩය 3* : සේවා ව්‍යවස්ථාවේ 17 (ඇ) (ii) යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු සුදුසුකම් :

4.3.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ/පන්තියේ වසර 10 ක සේවා කාලයක් සපුරා තිබීම. (ආයතන සංග්‍රහයේ V:2:5:4, XII :16:9, XII:16 :10 සහ XII :36 : 1: 4 (i) හා (ii) යන කොන්දේසි සහ විනය තීරණ වල කොන්දේසි යටතේ වසර 10 ක කාල සීමාව ගණනය කළ යුතුය.).

4.3.2 19(1)(ආ) යටතේ වන සුදුසුකම් සපුරා තිබීම හෝ අන්තර්කාලය තුළ සම්පූර්ණ කිරීමට හැකි බවට නීත්‍යානුකූලව පිළිගත හැකි ලේඛන මගින් තහවුරු කළ හැකි වීම.

4.3.3 සේවා ව්‍යවස්ථාවේ 14 (1) (ආ) යටතේ වන සුදුසුකම් සපුරා තිබීම.

4.3.4 ඉහත 4.1.3 හා 4.1.4 අවශ්‍යතා සපුරා තිබීම.

4.4 *කාණ්ඩය 4* : සේවා ව්‍යවස්ථාවේ 17(ඇ) (ii) සටහන 2 යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් :

4.4.1 2005.11.14 දිනට හෝ පෙර විශේෂ ශ්‍රේණියේ තනතුරකට විධිමත්ව පත් කර තිබීම.

4.4.2 ඉහත 4.3.1, 4.3.3 හා 4.3.4 අවශ්‍යතා සපුරා තිබීම.

2005.01.01 දිනට ඉහත කාණ්ඩ 4 යටතේ ද, 2005.07.01 හා 2006.01.01 යන දිනයන්ට ඉහත 1 හා 3 කාණ්ඩ යටතේ ද සුදුසුකම් ලබන නිලධාරීන් මේ සමග වන ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අමාත්‍යාංශය ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වෙත 2010.06.30 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනට විශ්‍රාම ගෙන සිටියේ වුව ද 2005.01.01 තෙක් හෝ එදිනට පසු දිනයක් තෙක් සේවයේ යෙදී සිටි සහ උසස් වීමට ඉහත 4 ඡේදයේ කවර හෝ කාණ්ඩයක් යටතේ සුදුසුකම් සපුරා ඇති, පෙර උසස් වීම් අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි නමුත් උසස් වීම් නොලද හෝ ඉල්ලුම් කිරීමට නොහැකිව වූ නිලධාරීන් හට මෙම උසස් වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

ඉල්ලුම්පත www.pubad.gov.lk ඔස්සේ ලබා ගත හැක.

අමාත්‍ය මණ්ඩලයේ නියෝග පරිදි,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 මැයි මස 06 වැනි දින.

**ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I පන්තියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත**

කාර්යාලයීය ප්‍රයෝජනය පිණිසයි.

| අයදුම්පත් අංකය : | S |
|---|---|
| | F |

(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

1. නම :
1.1 සම්පූර්ණ නම :——————.මෙය./මිය/මයා.
1.2 පත්වීම් ලිපියෙහි සඳහන් පරිදි නම :——————.

2. උපන් දිනය :——————.

3. පෞද්ගලික ලිපිනය :——————.

4. දුරකථන අංකය : 4.1 නිවස :—————. 4.2 ජංගම :—————.

5. 5.1 තනතුර :——————.
(දැනට දරන/දැනට විශ්‍රාමික නම් විශ්‍රාම යන අවස්ථාවේ දී දැරූ)

5.2 දැනට විශ්‍රාමික නම් විශ්‍රාම ගත් දිනය :——————.

6. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :——————.

7. කාර්යාලයීය ලිපිනය :——————.

8. කාර්යාලයීය දුරකථන අංකය :——————.

9. පත්වීම් දිනය :——————.

9.1 ශ්‍රී.ලං.ප.සේ II/II ශ්‍රේණියට (III පන්තියට) පත්වීම් දිනය :——————.

9.2 ශ්‍රී. ලං. ප. සේ. II/I ශ්‍රේණියට (II පන්තියට) උසස් වූ දිනය :——————.

9.3 ශ්‍රී. ලං. ප.සේ. I ශ්‍රේණියට (I පන්තියට) උසස් වූ දිනය :——————.
(1 ශ්‍රේණියට/I පන්තියට උසස්වීම් ලිපියේ සහතික කළ පිටපත 9.3 වශයෙන් අංක කර ඇමිණිය යුතුය).

10. I පන්තියට උසස් වීමෙන් පසු සේවයේ නොසිටි කාලසීමාවන් සහ විනයානුකූල දඬුවම් ලැබීම මත සේවා කාලය අඩුවීම් :

10.1 නිවාඩු ලබා ගැනීම මත සේවා කාලය අඩුවීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න) :——————.

| අනු අංකය | නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසි | කාල සීමාව | | සේවා කාලය අඩු වන දින ගණන | | |
|---|---|---|---|---|---|---|
| | | සිට | දක්වා | අවු. | මාස | දින |
| i | ආයතන සංග්‍රහයේ V : 2.5.4 | | | | | |
| ii | ආයතන සංග්‍රහයේ XII :16 | | | | | |
| iii | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 | | | | | |
| iv | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 | | | | | |
| v | ආයතන සංග්‍රහයේ XII :36 | | | | | |
| vi | වෙනත් (වැටුප් රහිත නිවාඩු) | | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | | | |

(නිවාඩු අනුමත කළ ලිපිවල සහතික කළ පිටපත් 10. 1 i, 10 .1 ii, 10. 1 iii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය).

10.2 විනය කරුණු මත සේවා කාලය අඩු වීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න) :——————.

| විනය තීරණය | චෝදනා පත්‍රය අනුව වරද සිදු වූ කාල සීමාව | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|
| | | අවු | මාස | දින |
| i. වැටුප් වර්ධක ..... ක් විලම්භනය කිරීම<br>ii. වෙනත් | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | |

(විනය තීරණ වල සහතික කළ පිටපත් 10.2 i, 10.2 ii, 10.1. iii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය)

10.3 10.1 හා 10.2 හි මුළු එකතුව : අවු:————, මාස:———, දින:———.

10.4 I පන්තියට පත් වූ දිනෙන් ඉදිරියට ඉහත 10.3 හි කාල සීමාව ඉවත් කළ විට දිනය :——————.

11. උසස් වීමට ඉල්ලුම් කළ හැකි දිනය :——————.
(2005.01.01, 2005.07.01 හා 2006.01.01 දින අතරින් කවර දිනය ද යන වග) :——————.

11.1 කාණ්ඩය 1 : ඉහත 10.4 දිනය සිට වසර 5 ක් සම්පූර්ණ වන දිනට පසුව එන ආසන්නතම උසස් වීම් දිනය හෝ 10.4 අදාළ නොවේ නම් I පන්තියට/ශ්‍රේණියට පත් වූ දින සිට වසර 5 සම්පූර්ණ කරන දිනය වේ.

11.2 කාණ්ඩය 2 : 2005.01.01 හෝ විශේෂ ශ්‍රේණියේ තනතුරකට විධිමත්ව පත්වීම ලැබූ දිනට පසුව එන ආසන්න උසස්වීම් දිනය වේ.

විශේෂ ශ්‍රේණියේ තනතුරට පත් කළ දිනය :

(අ) 2005.01.01 දිනට පෙර දිනයක් නම්, ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන දිනය 2005.01.01 වේ.

(ආ) 2005.01.01 - 2005.11.14 අතර නම් එදිනට පසුව එන ආසන්නම උසස්වීම් දිනය එනම් 2005.07.01 හෝ 2006.01.01 වේ.

(2005.11.14 දිනට පසුව විශේෂ ශ්‍රේණියේ තනතුරකට කරන ලද පත්වීම් මෙම කාණ්ඩය යටතට නොගැනේ.)

11.3 කාණ්ඩය 3 : ඉහත 10.4 දින සිට වසර 10 සම්පූර්ණ කරන දිනට පසුව එන ආසන්නතම උසස්වීම් දිනය හෝ 10.4 අදාළ නොවේ නම් I පන්තියට/ශ්‍රේණියට පත් වූ දින සිට වසර 10 සම්පූර්ණ කරන දිනය වේ.

11.4 කාණ්ඩය 4 : 2005.01.01 හෝ විශේෂ ශ්‍රේණියේ තනතුරකට විධිමත්ව පත්වීම ලැබූ දිනට පසුව එන ආසන්න උසස්වීම් දිනය වේ.

විශේෂ ශ්‍රේණියේ තනතුරට පත් කළ දිනය :

(අ) 2005.01.01 දිනට පෙර දිනයක් නම්, ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන දිනය 2005.01.01 වේ.

*ආ.* 2005.01.01 - 2005.11.14 අතර නම් එදිනට පසුව එන ආසන්නතම උසස්වීම් දිනය, එනම් 2005.07.01 හෝ 2006.01.01 වේ.

(2005.11.14 දිනට පසුව විශේෂ ශ්‍රේණියේ තනතුරකට කරන ලද පත්වීම් මෙම කාණ්ඩය යටතට නොගැනේ.).

11:5 ගැසට් නිවේදනයේ 4 ඡේදය අනුව සුදුසුකම් ලබන කාණ්ඩය :——————.

ඉහත පැහැදිලි කිරීම් අනුව ඉල්ලුම් කළ හැකි දිනය :——————.

12. *පූර්වාසන්න පස් වසර තුළ වැටුප් වර්ධක ලබා තිබීම :*

12:1 ඉහත 11.5 අනුව උසස් වීමට සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබේ/නැත ** (ආයතන සංග්‍රහයේ XII :16 :9, XII :16 :10 සහ XII :36:1:4 (i) හා (ii) යටතේ ලබා ඇති වැටුප් වර්ධක උසස් වීම සඳහා පිළිගනු නොලැබේ.).

* (අදාළ නොවන වචනය කපා හරින්න).

12:2. 11:5 හි සඳහන් දිනට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක ලබා නොමැති නම් වැටුප් වර්ධක 05 ලබන දින තෙක් උසස් වීමට සුදුසුකම් ලබන දිනය නැවත ගණනය කළ යුතුය. ඒ අනුව සුදුසුකම් ලබන දිනය** :——————.

** (වැටුප් වර්ධක පත්‍රිකාවල සහතික කළ පිටපත් 12:5 වශයෙන් අංක කර අමුණන්න)

13. *පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබීම :*

13.1 ගොනුව අනුව, ඉහත 11:5 යටතේ සඳහන් උසස්වීම් දින හෝ 12:2 යටතේ සංශෝධිත දිනයට පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනය දඬුවමකට ලක් වී නොමැත. (දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මේ බව ලිඛිත ප්‍රකාශයකින් සහතික කළ යුතුය. ඉල්ලුම්පතෙහි “ආ” කොටස යටතේ).

13:2 13:1 හි සඳහන් කාලසීමාව තුළ විනය දඬුවමකට ලක්ව ඇති අතර 10:2 යටතේ කරුණු සඳහන් කර ඇත්නම් සහ ඒ අනුව 11:5 යටතේ සඳහන් දිනය සංශෝධනය වේ නම් එම දිනය :——————.

13.3 11:5 යටතේ සඳහන් දිනය 12:2 හා 13:2 අනුව සංශෝධනය වේ නම් නව සංශෝධිත දිනය :——————.

14. *පූර්වාසන්න පස් වසර තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයුම අනුව වැඩ, හැසිරීම යහපත් බව පිළිබිඹු වීම :*

ඉහත 11:12 හෝ 13 අනුව සුදුසුකම් ලබන දිනට අදාල වර්ෂයට පූර්වාසන්න වර්ෂ 05 පහත වගුවෙහි පළමු තීරුවේ සටහන් කළ යුතුයි. අදාල කාර්ය සාධන වාර්තා 05 හි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය. කාර්ය සාධන වාර්තාවේ අවසාන ඇගයුමෙහි විකල්ප නිර්දේශ එකකට වඩා දක්වා ඇති සහ අදාළ නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති වාර්තා පිළිගනු නොලැබේ.

| *වර්ෂය* | *අවසාන ඇගයුම විශිෂ්ඨයි/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි/සතුටුදායකයි/ අසතුටුදායකයි* | *අදාළ නිලධාරියා අත්සන් තබා, මුද්‍රා තබා ඇත/නැත* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

එක් එක් වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව සෑම පේළියක් හා තීරුවක්ම සම්පූර්ණ කළ යුතුය.

15. *සේවා ව්‍යවස්ථාවේ 14 (ඇ) සුදුසුකම සම්පූර්ණ කර තිබීම (අදාළ වන්නේ නම් සම්පූර්ණ කරන්න) :*

15:1 පශ්චාත් උපාධියේ නම :——————.

15:2 විෂය ක්ෂේත්‍රය :——————.

15:3 එම උපාධිය පිරිනමන ලද විශ්ව විද්‍යාලය :——————.

15:4 එම විශ්ව විද්‍යාලය,විශ්ව විද්‍යාලයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගෙන තිබේද යන වග :——————.

15:5 උපාධි කාල සීමාව (ආරම්භක හා අවසාන දිනය) :——————.

15:6 උපාධිය වලංගු දිනය :——————.
(15:1 වශයෙන් අංක යොදා උපාධි සහතිකය සහ විස්තරාත්මක ප්‍රතිඵල සටහනෙහි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)

15:7 මේ වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ නැති නම් සහ දැනට පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා ලියාපදිංචි වී තිබේනම් ලියාපදිංචි වූ දිනය :——————.
පාඨමාලාව අවසන් වන දිනය :——————.
(සනාථ කිරීමට අදාළ ලේඛන අංක 15:6 වශයෙන් අංක යොදා ඇමිණිය යුතුය).

16. සේවා ව්‍යවස්ථාව 19(1)(ආ) සුදුසුකම සම්පූර්ණ කර තිබීම. (අදාළ වන්නේනම් සම්පූර්ණ කරන්න) :

16:1 නිබන්ධනයේ මාතෘකාව :——————.

16:2 නිබන්ධනය සම්පූර්ණ කළ (වලංගු) දිනය :——————.

(සම්පූර්ණ කළ බවට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් නිකුත් කළ සහතිකයේ සහතික කළ පිටපත අංක 16.1 වශයෙන් අංක යොදා ඇමිණිය යුතුය.)

16:3 මේ වන විට සම්පූර්ණ කර නැති නම් සහ නිබන්ධනය ඉදිරිපත් කිරීමට ලියාපදිංචි වී තිබේ නම්,

16:3:1 ලියාපදිංචි වූ දිනය :——————.

16:3:2 අවසන් වන දිනය :——————.

(සනාථ කිරීමට අදාළ ලේඛන අංක 16:3 වශයෙන් අංක යොදා ඇමිණිය යුතුය)

17. විශේෂ ශ්‍රේණියේ තනතුරකට පත් කර තිබීම (අදාළ වන්නේනම් සම්පූර්ණ කරන්න) ඃ

| *කාල සීමාව* | *තනතුරු නාමය සහ සේවා ස්ථානය* | *පත්වීම පිරිනමා ඇත්තේ අමාත්‍ය මණ්ඩලය/ ආණ්ඩුකාරතුමන්/ රාජ්‍ය සේවා කොමිෂන් සභාව* | *පත්වීමේ ස්වභාවය රාජකාරි ඉටු කිරීම/වැඩ බැලීම/නිත්‍ය/ කොන්ත්‍රාත්* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(සියළුම පත්වීම් ලිපිවල සහතික කළ පිටපත් 17:1, 17:2 වශයෙන් අංක යොදා ඇමිණිය යුතුය).

ඉහත 15, 16,හා 17 අතුරින් අදාළ වන කරුණු සඳහා පිළිතුරු සපයන්න.

ඉහත අංක 01 සිට 17 තෙක් නිරවද්‍ය හා සම්පූර්ණ තොරතුරු සහිත ඉල්ලුම්පත සහ අමුණා එවන ලෙස සඳහන් කර ඇති සියළු ලේඛනවල සහතික කළ පිටපත් කරුණට අදාළ අංකය එක් එක් ලේඛනයේ දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර **අංක පිළිවෙලින් අමුණා ගොනුවක් වශයෙන් සකස් කර** මේ සමග ඉදිරිපත් කරමි.

——————,
ඉල්ලුම්කරුගේ අත්සන,
තනතුරු නාමය සහ නිල මුද්‍රාව.

දිනය :——————.

*(ආ) කොටස ඃ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුයඃ*

ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය/අදාළ අමාත්‍යාංශය,

1. නිලධාරියා ඉහත සඳහන් කර ඇති සියලු කරුණු නිවැරදිය.
2. අංක 10, 12, 13 හා 17 ට අදාළ කරුණු ගොනුව අනුව සසඳා බලන ලදී. සඳහන් කර ඇති කරුණු නිවැරදි බව ද සියළු තොරතුරු සම්පූර්ණව ඉදිරිපත් කර ඇති බව ද අදාළ සියළු ලේඛනවල සහතික කළ පිටපත් අමුණා ඉදිරිපත් කර ඇති බව ද සහතික කරමි.
3. නිලධාරියාට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ සිදු වෙමින් පවතියි/ නොපවතියි.

   3:1 ඉහත පිළිතුර "පවතියි" නම් වරද කළ දිනය :——————.

   3:2 විනය බලධාරියා විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය :——————.

4. ..................................... මහතා/මහත්මිය/මෙනෙවිය හෝ රාජකාරි/පැමිණීම/හැසිරීම සතුටුදායකය. ඔහුගේ/ඇයගේ කාර්යසාධනය, නායකත්වය, හැකියාව හා ඊළඟ උසස්වීමට අදාළව තනතුරු හා වගකීම් දැරීමේ හැකියාව සලකා බැලීම්, ඔහු/ඇය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.
5. නිවැරදිව, අනූනව සම්පූර්ණ කළ අයැදුම්පත ද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙලින් අදාළ ලේඛනවල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමග එවමි.

——————,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන, තනතුරු නාමය,
සහ නිල මුද්‍රාව.

දිනය :——————.

*සටහන.- නොගැලපෙන වචන කපාහරින්න.*

*(ඇ) කොටස - අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය ඃ-*

ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ...................................... මහතා/මහත්මිය/මෙනවියගේ රාජකාරි හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමග එකඟ වෙමි/එකඟ නොවෙමි.
2. නිලධාරියාගේ රාජකාරි/හැසිරීම/විශේෂ කුසලතා හා කාර්ය සාධනය අගැයීමට ලක් කළෙමි.

   ............................................................. මහතා/මහත්මිය/මෙනෙවිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි**.

   (නිර්දේශ නොකරන්නේනම් හේතුව කෙටියෙන් සඳහන් කරන්න.)

3. නිවැරදිව, අනූනව සම්පූර්ණ කළ අයැදුම්පතද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙලින් අදාළ ලේඛනවල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව ද මේ සමග එවමි.

——————,
ලේකම්

——————,
—————— අමාත්‍යාංශය,

නිල මුද්‍රාව

දිනය :——————.

05-565

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි තනතුරේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2010

01. ඉහත තනතුරුවලට බඳවාගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව, කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි තනතුරේ III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

03. *වයස් සීමාව.-* ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

04. *(I) අධ්‍යාපන සුදුසුකම්.-*

(i) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම ; සහ

(ii) ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව අ.පො.ස (උ.පෙළ) විෂයයන් 03 කින් එකවර සමත්වීම.

(II) *වෘත්තීය සුදුසුකම්.-* ඉහත 04(I) හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයැදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය :

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් හෝ පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව; හෝ

(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව; හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව; හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව; හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම; හෝ

(vi) ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

05. *වැටුප් පරිමාණ.-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ MN 3-2006 A

රු. 15,005 - 180 x 4 - 240 x 6 - 320 x 11 - 360 x 20 - රු. 27,885/- 4 වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු අතර, පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

06. *සේවා කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(2) තෝරාගන්නා ලබන අයැදුම්කරුවන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අභිමතය පරිදි දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරනු ඇත.

(3) තෝරාගන්නා අයැදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත්වනු ඇත.

(4) තෝරාගනු ලබන අයැදුම්කරුවන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර, දැනටමත් රජයේ සේවකයෙක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

(5) තෝරාගනු ලබන අයැදුම්කරුවන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග හා දෙපාර්තමේන්තු උපදෙස්වලට ද යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

07. (I) *බඳවා ගැනීමේ ක්‍රමය.-* මෙම විභාගය තාක්ෂණ සේවා මණ්ඩලයේ අධීක්ෂණය මත විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

(II) *විභාග ක්‍රමය :*

(i) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) අපේක්ෂකයා විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(III) *විභාගයේ විෂයන්.-* විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ :

(1) බුද්ධි පරීක්ෂණය ;

(2) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය.

08. *විෂය නිර්දේශය.-*

(I) *බුද්ධි පරීක්ෂණය.-* කාලය පැය 01 කි. මුළු ලකුණු 100යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(II) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය.-* කාලය පැය 03 කි. මුළු ලකුණු 100 යි. ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව. ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු හැකියාව විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ.

ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ.

* ඉහත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන ජ්‍යාමිතික උපකරණ හා සෙසු උපාංග අයදුම්කරු විසින් විභාග ශාලාවට රැගෙන ආ යුතුය.

09. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. *විභාග ගාස්තු.-* විභාග ගාස්තුව රු. 250/- කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 20-03-20-13 ආදායම් ශීර්ෂය යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

11. *අයදුම් කළයුතු ක්‍රමය.-*

(*අ*) අයදුම්පත්‍ර.- ඒ 4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය භාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(i) අංක 01 සිට 03 තෙක් ඡෙදයන් පළමුවන පිටුවට ද,

(ii) අංක 04 සිට ඉදිරියට වන ඡෙදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

(iii) ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(*ආ*) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2010 ජූනි මස 21 වැනි දින හෝ ඊට කලින් පහත ලිපිනයට එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී III වන ශ්‍රේණියට බඳවා ගැනීම - 2010" යනුවෙන් සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(*ඇ*) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කල ඡායා පිටපතක්ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 මැයි මස 21 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි තනතුරේ III වන ශ්‍රේණියට බඳවාගැනීමේ විවෘත තරග විභාගය - 2010**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :———————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා: : PERERA, A. B. C.

1.2 සම්පූර්ණ නම :———————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :———————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 2.1 ස්ථිර ලිපිනය :———————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය
සිංහලෙන්/දෙමළෙන්

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ස්ත්‍රී - 1

3.2 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :

3.3 **2010 ජුනි මස 21 දිනට වයස :**
අවුරුදු : මාස : දින :

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :———————.
(ii) විභාග අංකය :———————.
(iii) ප්‍රතිඵල :———————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :———————.

(ii) විභාග අංකය :———————.

(iii) ප්‍රතිඵල :———————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 *තාක්ෂණ සුදුසුකම් :*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතික පත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

6.0 වෙනත් සුදුසුකම් :———————.

7.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

7.1 දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ලිපිනය :———————.
7.2 දැනට දරන තනතුර :———————.
7.3 සේවා කාලය :———————.
7.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :—————.

8.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

ඔව් නැත

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :———————.

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :———————.

(ii) ලදුපත් අංකය හා දිනය :———————.

(iii) ගෙවූ මුදල :———————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

10.0 *අයදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

*(ඇ)* තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

_________________,

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

11.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිටදී .............................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

_________________,

අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :——————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

05-417

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.